නිෂ්පාදකයින්ගේ ශුභසාධනය ගැන ඉතා දුෂ්කර තීරණ ගැනීමට සිදුවනු ඇත. ඉතිරි වී ඇති ඒකාධිකාර බල සහ නිෂ්ඵල පාලන ඉවත් කිරීමට සිදුවනු ඇත. හුදෙක් ආර්ථික ප්‍රගතිය සඳහා ප්‍රතිපත්තීන් සකස් කරන විට, රටේ මහජනයා අතර ආදායම් බෙදීයෑම කෙසේ සකස් විය යුතුද යන්න ගැනත් තීරණයක් අවශ්‍ය විය හැකිය. එහෙත් 1978 ආර්ථිකය හැඩගැසුණු ආකාරය දෙස බලන විට එක් කරුණක් පැහැදිලිවම දක්නට ලැබේ. එනම්, උචිත ප්‍රතිපත්ති වාතාවරණයක් ඇත්නම්, නොකඩවා හා සීඝ්‍රලෙස වැඩෙන්නට ශ්‍රී ලංකා ආර්ථිකයට ශක්තියක් තිබෙන බවයි.

## ජාතික නිෂ්පාදිතය සහ ආදායම

පවත්නා සාධක වියදම් මිළ අනුව, 1978 දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශලක්ෂ 36,139 ක් ලෙස තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙය ඉකුත් වසරට වඩා සියයට 23.5 ක වැඩිවීමකි. මිළ වැඩිවීම සඳහා ගැලපූ ස්ථාවර (1959) මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශලක්ෂ 13,002 ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. 1977 දී සියයට 4·4 ක් වූ වර්ධනය හා සසඳන කල, මෙයින් සියයට 8·2 ක වර්ධන වේගයක් පිළිබිඹු වෙයි. 1978 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය, ඉකුත් දශකය තුළ දක්නට ලැබුණ සාමාන්‍ය වර්ධන වේගය මෙන් දෙගුණයකටත් වඩා වැඩි වූ අතර, මෑත යුගයේදී ඇතිවූ ඉහළම වර්ධන වේගය වන, 1968 වර්ෂයේ සියයට 8·4 ට බොහෝදුරට සමාන විය. ආර්ථිකයේ ඉතිරි අංශ දියුණු නොවී හෝ පිරිහෙමින් තිබියදී ප්‍රධාන වශයෙන් අංශ කීපයක පමණක් ආර්ථික වර්ධනයක් දක්නට ලැබිණි. කලින් වර්ෂ වලදී මෙන් නොව, 1978 දී සියළුම අංශවල ඉහළ මට්ටමක ක්‍රියාකාරිත්වයක් තිබීම පැහැදිලි ලක්ෂණයක් විය. මීත් කැපී පෙනෙන සුළු වර්ධනයක් දක්නට ලැබුණේ පතල් හා කැනීම්, තැනීම් කටයුතු, විදුලිය, මූල්‍ය, නිමවුම් කර්මාන්තය හා වෙළඳම යන අංශ වලය.

1978 දී ශ්‍රී ලංකාවේ වසර මැද ජනගහනය එක් කෝටි හතලිස් දෙලක්ෂයක් වී යැයි තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙයින් සියයට 1·7 ක වාර්ෂික වර්ධනයක් පිළිබිඹු වෙයි. මේ අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය සියයට 6·4 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් මූර්ත වශයෙන් රු. 917 ක් විය. ඉකුත් වර්ෂයේදී මෙය වැඩි වී තිබුණේ සියයට 2·6 කිනි.

1976 දී හා 1977 දී ප්‍රධාන වශයෙන්ම අපනයන මිළ ගණන් තියුණු ලෙස ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් පිළිවෙලින් සියයට 35 කින් හා 31 කින් වර්ධනය වූ ශ්‍රී ලංකාවේ වෙළඳ අනුපාතය 1978 දී සුළු වශයෙන් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ අනුපාතයේ වෙනස්වීම් අනුව මූර්ත දළ ජාතික නිෂ්පාදිතය ගැලපීමෙන් සකස් කරගනු ලබන මූර්ත ජාතික ආදායම 1978 දී සියයට 7·8 කින් වැඩිවිය. මෙය මූර්ත ජාතික නිෂ්පාදිතයෙහි වර්ධන වේගයට වඩා අඩු වනුයේ සුළු වශයෙනි.

1978 දී පවත්නා වෙළඳ මිළ අනුව දළ ජාතික වියදම රුපියල් දශලක්ෂ 38,826 වී යැයි ඇස්තමේන්තු කර ඇත. මෙය 1977 ට වඩා සියයට 25 ක වැඩිවීමකි. පාරිභෝජන වියදම සියයට 29 කින් වැඩි වූ අතර, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 65 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. පෞද්ගලික හා රජයේ පාරිභෝජනය සියයට 29 බැගින් සමාන අන්දමින් වැඩි වූ අතර ප්‍රාග්ධන සම්පාදනයෙහි ප්‍රධාන වැඩිවීම සඳහා රාජ්‍ය අංශය දායක විය. එසේ වුවද 1978 දී ඇති වූ මිළ වෙනස්වීම් ද මෙම සංඛ්‍යා වලට (විශේෂයෙන්ම ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ හේතුවෙන් උද්ගත වූ වැඩි ආනයන වියදම්) ඇතුලත් වන හෙයින් ඒවා ප්‍රවේශමෙන් සැලකිල්ලට ගත යුතුය.

## 1·1 සංඛ්‍යා සටහන

### ජාතික නිෂ්පාදිතය, ආදායම, වියදම සහ ජනගහනය—1959–1978

| වර්ෂය | දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිළ අනුව | | දළ ජාතික වියදම පවත්නා වෙළඳ මිළ අනුව | | දළ දේශිය නිෂ්පාදිතය ස්ථාවර සාධක මිළ අනුව | | දළ ජාතික නිෂ්පාදිතය (1959) ස්ථාවර සාධක මිළ අනුව | | මූර්ත ජාතික ආදායම | | වසර මැද ජනගහනය | | ඒකජන දළ ජාතික නිෂ්පාදිතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශලක්ෂ | වර්ධන අනුපාතිකය % | ප්‍රමාණය රු. දශලක්ෂ | වර්ධන අනුපාතිකය | ප්‍රමාණය රු. ද.ලක්ෂ % | වර්ධන අනුපාතිකය % | ප්‍රමාණය රු. ද.ලක්ෂ | වර්ධන අනුපාතිකය % | ප්‍රමාණය රු. ද.ලක්ෂ | වර්ධන අනුපා–තිකය % | ප්‍රමාණය 1000 | වර්ධන අනුපා–තිකය % | ප්‍රමාණය රුපියල් | වර්ධන අනුපා–තිකය % |
| 1959 | 5,893 | — | 6,433 | — | 5,930 | — | 5,893 | — | 5,893 | — | 9,625 | — | 612 | — |
| 1960 | 6,287 | 6·7 | 6,667 | 3·6 | 6,332 | 6·8 | 6,289 | 6·7 | 6,278 | 6·5 | 9,896 | 2·8 | 635 | 3·8 |
| 1961 | 6,313 | 0·4 | 6,835 | 2·5 | 6,465 | 2·1 | 6,425 | 2·2 | 6,274 | - 0·1 | 10,168 | 2·7 | 632 | −0·5 |
| 1962 | 6,503 | 3·0 | 6,923 | 1·3 | 6,760 | 4·6 | 6,710 | 4·4 | 6,628 | 5·6 | 10,443 | 2·7 | 643 | 1·7 |
| 1963 | 6,797 | 4·5 | 7,329 | 5·9 | 6,951 | 2·8 | 6,900 | 2·8 | 6,658 | 0·5 | 10,646 | 1·9 | 648 | 0·8 |
| 1964 | 7,291 | 7·3 | 7,758 | 5·9 | 7,397 | 6·4 | 7,363 | 6·7 | 7,048 | 5·9 | 10,903 | 2·4 | 675 | 4·2 |
| 1965 | 7,484 | 2·6 | 8,069 | 4·0 | 7,565 | 2·3 | 7,551 | 2·6 | 7,242 | 2·8 | 11,164 | 2·4 | 676 | — |
| 1966 | 7,705 | 3·0 | 8,301 | 2·9 | 7,854 | 3·8 | 7,818 | 3·5 | 7,313 | 1·0 | 11,440 | 2·5 | 683 | 1·0 |
| 1967 | 8,265 | 7·3 | 8,984 | 8·2 | 8,255 | 5·1 | 8,210 | 5·0 | 7,543 | 3·1 | 11,703 | 2·3 | 702 | 3·8 |
| 1968 | 9,876 | 19·5 | 10,664 | 18·7 | 8,937 | 8·3 | 8,901 | 8·4 | 8,117 | 7·6 | 11,992 | 2·5 | 742 | 5·7 |
| 1969 | 10,725 | 8·6 | 11,586 | 8·6 | 9,369 | 4·8 | 9,301 | 4·5 | 8,487 | 4·6 | 12,252 | 2·2 | 759 | 2·3 |
| 1970 | 11,636 | 8·5 | 12,640 | 9·1 | 9,828 | 4·9 | 9,743 | 4·8 | 8,828 | 4·0 | 12,514 | 2·1 | 779 | 2·0 |
| 1971 | 11,860 | 1·9 | 12,587 | −0·4 | 9,836 | ... | 9,769 | 0·3 | 8,814 | 0·2 | 12,699 | 1·5 | 769 | −1·0 |
| 1972 | 12,710 | 7·2 | 13,497 | 7·2 | 10,146 | 3·2 | 10,085 | 3·2 | 9,115 | 3·4 | 12,951 | 2·0 | 779 | 1·2 |
| 1973 | 15,274 | 20·2 | 16,630 | 23·2 | 10,514 | 3·6 | 10,470 | 3·8 | 9,300 | 2·0 | 13,091 | 1·1 | 800 | 2·7 |
| 1974 | 19,858 | 30·0 | 21,469 | 29·1 | 10,892 | 3·6 | 10,867 | 3·8 | 9,724 | 4·6 | 13,284 | 1·5 | 818 | 2·3 |
| 1975 | 22,067 | 11·1 | 23,934 | 11·5 | 11,194 | 2·8 | 11,167 | 2·8 | 9,798 | 0·8 | 13,514 | 1·7 | 826 | 1·0 |
| 1976* | 24,215 | 9·7 | 26,204 | 9·5 | 12,542 | 3·1 | 11,506 | 3·0 | 10,199 | 4·0 | 13,730 | 1·6 | 838 | 1·4 |
| 1977* | 29,271 | 20·9 | 31,061 | 18·5 | 12,042 | 4·3 | 12,016 | 4·4 | 11,127 | 9·1 | 13,971 | 1·7 | 860 | 2·6 |
| 1978* | 36,139 | 23·5 | 38,668 | 24·5 | 13,043 | 8·3 | 13,002 | 8·2 | 11,943 | 7·3 | 14,184 | 1·7 | 917 | 6·4 |

මූලාශ්‍ය: ශ්‍රී ලංකා මහ බැංකුව

* තාවකාලිකයි.

## 1 · 2 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1959) සාධක පිරිවැය මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය

| අංශ | 1959 | | 1974 | | 1975 | | 1976 | | 1977 | | 1978 | | 1977 ට වඩා 1978 ප්‍රතිශත වැඩිවීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | |
| 1. කෘෂිකර්මය දව ආදී වන ද්‍රව්‍ය දඩයම සහ ධීවර කර්මාන්තය .. | 2,302 | 39.1 | 3,582 | 32.9 | 3,596 | 32.2 | 3,568 | 31.0 | 3,828 | 31.9 | 3,990 | 30.7 | 4.2 |
| 1.1 කෘෂිකර්මය .. | 2,148 | 36.5 | 3,328 | 30.6 | 3,352 | 30.0 | 3,308 | 28.8 | 3,568 | 29.7 | 3,690 | 28.4 | 3.4 |
| 1.1.1 තේ .. | (642) | (10.9) | (699) | (6.4) | (733) | (6.6) | (674) | (5.9) | (715) | (6.0) | (682) | (5.2) | (−4.6) |
| 1.1.2 රබර් .. | (183) | (3.1) | (259) | (2.4) | (295) | (2.6) | (299) | (2.6) | (296) | (2.5) | (315) | (2.4) | ( 6.4) |
| 1.1.3 පොල් .. | (404) | (6.9) | (387) | (3.6) | (419) | (3.7) | (365) | (3.2) | (332) | (2.7) | (385) | (3.0) | (16.0) |
| 1.1.4 වී .. | (312) | (5.3) | (656) | (6.0) | (479) | (4.3) | (513) | (4.4) | (687) | (5.7) | (775) | (6.0) | (12.8) |
| 1.1.5 වෙනත් .. | (453) | (7.7) | (1,327) | (12.2) | (1,426) | (12.8) | (1,457) | (12.7) | (1,538) | (12.8) | (1,533) | (11.8) | (−0.3) |
| 1.2 දව ඈ. වන ද්‍රව්‍ය .. | 93 | 1.6 | 120 | 1.1 | 114 | 1.0 | 120 | 1.0 | 112 | 0.9 | 133 | 1.0 | 18.8 |
| 1.3 ධීවර කර්මාන්තය .. | 61 | 1.0 | 134 | 1.2 | 137 | 1,2 | 140 | 1.2 | 148 | 1.2 | 167 | 1.3 | 12.8 |
| 2. පතල් හා කැනීම් .. | 31 | 0.5 | 191 | 1.7 | 248 | 2.2 | 354 | 3.1 | 311 | 2.6 | 411 | 3.2 | 32.2 |
| 3. නිමැවුම් කර්මාන්තය .. | 682 | 11.6 | 1,420 | 13.1 | 1,462 | 13.1 | 1,489 | 12.9 | 1,505 | 12.5 | 1,632 | 12.6 | 8.4 |
| 3.1 අපනයන සැකසීම .. | 373 | 6.3 | 546 | 5.0 | 460 | 4.1 | 432 | 3.7 | 435 | 3.6 | 446 | 3.4 | 2.5 |
| 3.2 කම්හල් කර්මාන්ත .. | 263 | 4.5 | 770 | 7.1 | 832 | 7.4 | 871 | 7.6 | 881 | 7.3 | 987 | 7.6 | 12.0 |
| 3.3 සුළු කර්මාන්ත .. | 46 | 7.8 | 104 | 1.0 | 171 | 1.5 | 185 | 1.6 | 189 | 1.6 | 200 | 1.5 | 5.8 |
| 4 කැනීම් කටයුතු .. | 283 | 4.8 | 553 | 5.1 | 503 | 4.5 | 531 | 4.6 | 480 | 4.0 | 629 | 4.8 | 31.0 |
| 5. විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා .. | 9 | 0.1 | 84 | 0.8 | 91 | 0.8 | 99 | 0.9 | 102 | 0.8 | 123 | 0.9 | 20.6 |
| 6. ප්‍රවාහණය, ගබඩා කිරීම සහ පණිවුඩ .. | 541 | 9.2 | 1,054 | 9.7 | 1,100 | 9.8 | 1,143 | 9.9 | 1,198 | 10.0 | 1,285 | 9.9 | 7.3 |
| 7. තොග සහ සිල්ලර වෙළඳාම .. | 801 | 13.6 | 1,450 | 13.3 | 1,501 | 13.4 | 1,545 | 13.4 | 1,623 | 13.5 | 1,780 | 13.6 | 9.7 |
| 7.1 ආනයන .. | 139 | 2.3 | 161 | 1.5 | 125 | 1.1 | 146 | 1.3 | 147 | 1.2 | 261 | 2.0 | 77.5 |
| 7.2 අපනයන .. | 104 | 1.8 | 123 | 1.1 | 171 | 1.5 | 126 | 1.1 | 243 | 2.0 | 277 | 2.1 | 14.0 |
| 7.3 දේශීය .. | 558 | 9.5 | 1,166 | 10.7 | 1,205 | 10.8 | 1,273 | 11.0 | 1,233 | 10.3 | 1,242 | 9.5 | 0.7 |
| 8. බැංකු. රක්ෂණය සහ නිශ්චල දේපල .. | 51 | 0.9 | 166 | 1.5 | 184 | 1.6 | 191 | 1.7 | 229 | 1.9 | 263 | 2.0 | 14.8 |
| 9: නිවාස අයිතිය .. | 201 | 3.4 | 344 | 3.2 | 350 | 3.1 | 353 | 3.1 | 360 | 3.0 | 374 | 2.9 | 3.9 |
| 10. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂාව .. | 301 | 5.1 | 609 | 5.6 | 646 | 5.8 | 676 | 5.9 | 703 | 5.8 | 760 | 5.8 | 8.1 |
| 11. සේවා .. | 728 | 12.3 | 1,441 | 13.3 | 1,513 | 13.5 | 1,593 | 13.8 | 1,704 | 14.2 | 1,797 | 13.8 | 5.5 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය .. | 5,930 | 100.6 | 10,892 | 100.2 | 11,194 | 100.2 | 11,543 | 100.3 | 12,042 | 100.2 | 13,043 | 100.3 | 8.3 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | − 37 | −0.6 | − 25 | −0.2 | − 27 | −0.2 | − 37 | − 0.3 | − 25 | −0.2 | − 41 | −0.3 | — |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | 5,893 | 100.0 | 10,867 | 100.0 | 11,167 | 100.0 | 11,506 | 100.0 | 12,016 | 100.0 | 13,001.9 | 100.0 | 8.2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY

**ආංශික වර්ධනය**

1959 පදනම් වර්ෂය හැටියට ගෙන, ඉකුත් පස් වසර තුළදී මූර්ත ජාතික නිෂ්පාදනයෙහි (1959 ස්ථාවර මිල ගණන් අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේ) ආංශික බෙදා දැක්වීමක් 1·2 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

1977 හා 1978 අතර තුරදී දළ ජාතික නිෂ්පාදිතයෙහි විවිධ අංශවල දායකත්වය වෙනස් වී ඇත්තේ සුළු වශයෙනි. මින් පිළිබිඹු වනුයේ 1978 දී සෑම අංශයකම පාහේ නිපැයුමෙහි වර්ධනයක් වාර්තා වී ඇති බවය. මේ අතර කෘෂිකර්ම අංශයෙහි දායකත්වය සියයට 32 සිට සියයට 31 දක්වා පහත වැටීමත්, තැනීම් කටයුතු අංශයේ දායකත්වය සියයට 4 සිට 5 දක්වා වර්ධනය වීමත් කැපී පෙනෙයි. කෘෂිකර්ම අංශයේ දායකත්වය සුළු වශයෙන් පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, තේ නිෂ්පාදනය පහත වැටීම හා අනෙකුත් අංශ කීපයක වර්ධනය වේගයෙන් සිදුවීත්මය. තැනීම් කටයුතු අංශය වර්ධනය වූයේ, තැනීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වඩා පහසුවෙන් ලබාගත හැකි වීම නිසා එහි ක්‍රියාකාරිත්වය දියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

1959 වසර හා සසඳන විට, 1978 දී (විසි වසරක කාලය) කෘෂිකර්ම අංශයේ දායකත්වය සියයට 39 සිට 31 දක්වා අඩු වී ඇති අතර, කර්මාන්ත අංශයේ දායකත්වය සියයට 12 සිට 13 දක්වා වැඩි වී තිබීම සැලකිය යුත්තකි. තේ, රබර්, හා පොල් නිෂ්පාදනයට අදාල අපනයන සැකසුම් කර්මාන්තය හැර, අනෙකුත් කර්මාන්ත අංශයෙහි දායකත්වය 1959 දී සියයට 12 සිට 1978 දී සියයට 9 දක්වා පහළ වැටුණි. ස්ථාවර වටිනාකම අනුව කෘෂිකර්මය සියයට 73 කින් වර්ධනය වී ඇති අතර ඉතා පහත් පදනමකින් ඇරඹුන කර්මාන්ත අංශය සියයට 139 කින් වර්ධනය වී ඇත. කර්මාන්ත, කෘෂිකර්මාන්තයට වඩා තරමක් වැඩි වේගයකින් වර්ධනය වී තිබුනද, ජාතික නිෂ්පාදනයෙහි කැපී පෙනෙන සුළු දායකත්වයක් ඉසිලීමට තරම් වේගයකින් එය වර්ධනය වී නොමැති බව ඉතා පැහැදිලිය. ඉකුත් විසිවස තුළදී කර්මාන්ත අංශයෙහි වර්ධනය සාපේක්ෂ වශයෙන් සුළු වීමට හේතු වන්නට ඇත්තේ මෙම කාලසීමාවේ වැඩි කොටසක් තුළදී බලපැවැත්වුනු දැඩිපාලනයන් සහ පමණ ඉක්මවා ආරක්ෂාව සැලසීම මෙන්ම කර්මාන්තයේ ඉහළ ආනයන ආදේශක ස්වභාවය නිසා, එකතු වූ වටිනාකම අල්පවීම විය හැකිය. කෘෂිකර්ම අංශයෙහි දායකත්වය අඩුවීම හා පතල් හා කැනීම්, විදුලිය, මූල්‍ය හා අනෙකුත් සේවා වැනි සුළු අංශවල සාපේක්ෂ වශයෙන් වූ අල්ප වර්ධනය හැරුණු විට ආර්ථික ව්‍යූහය මෙම කාලසීමාව තුළදී ඉතා සුළු වශයෙන් පමණක් වෙනස් වී ඇති බවද සැලකිය යුතුය.

1978 දී කෘෂිකර්මාන්තය දැව ඈ වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය ඇතුළත් වන කෘෂිකර්ම අංශය සියයට 4 කින් වර්ධනය විය. ඉකුත් වර්ෂයේදී සියයට 7·3 වර්ධනයක් ඇති වූ වැවිලි අංශය (තේ, රබර් හා පොල්) සියයට 3 ක වර්ධනයක් පෙන්විය. මෙසේ වූයේ තේ නිෂ්පාදනයේ පිරිහීමක් තිබුණද එය සමහන් කරමින් රබර් හා පොල් නිෂ්පාදනය වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. දේශීය කෘෂිකර්මාන්තයෙහි, වී නිෂ්පාදනය යහපත් කාලගුණය හා ඉහළ මිළ ගණන් ආධාර වීමෙන් සියයට 13 කින් වර්ධනය වූ නමුදු, මෙම අංශයේ ඉතිරි කොටස් වල ක්‍රියාකාරිත්වය සමබර නොවූ බව පෙනී යයි. අතිරේක ආහාර භෝග නිෂ්පාදනය 1977 මට්ටමේම තිබූ බවට ඇස්තමේන්තු කර ඇත. 1978 දී මිරිස්, රතුළූනු හා අර්තාපල් වැනි වැදගත් භෝග නිෂ්පාදනය පහත වැටුණි. එහෙත් පළතුරු හා එළවළු නිෂ්පාදනයෙහි දියුණුවක් ඇතිවිය. ධීවර කර්මාන්තය සියයට 13 කින් පමණ වර්ධනය වූ නමුත්, පශු සම්පත පිරිහිණි. සාමාන්‍ය වශයෙන් ගත්කල දේශීය කෘෂිකර්මයෙහි ක්‍රියාකාරිත්වය 1978 දී අසමබර තත්වයක පැවතුණි.

1978 දී පතල් හා කැනීම් අංශය සැලකිය යුතු වර්ධනයක් පෙන්විය. එහි එකතු වූ අගය 1977 ට වඩා තුනෙන් එකකින් වැඩිවිය. මෑත කාලය තුළදී මෙම අංශයෙහි වර්ධනයට හේතු වූයේ මැණික් කර්මාන්තයෙහි ව්‍යාප්තියයි. කලකට පෙර දිවයිනේ ඉතා සුළු ප්‍රදේශයකට පමණක් සීමා වී තිබූ මෙම කර්මාන්තය, බොහෝ දෙනෙකුට වැඩදායක සේවා නියුක්තියක් සලසමින් අළුත් ප්‍රදේශ රාශියක් පුරා පැතිර ගොස් ඇත. එසේ වුවද රේගු වාර්තාවලින් හෙලි වනුයේ 1978 දී මැණික් අපනයනය පහළ වැටුණු බවය. මේ අනුව වාර්තාගත මැණික් අපනයන මගින් අගයනු ලබන මෙම කර්මාන්තයෙහි නිෂ්පාදනය 1978 දී පහත වැටී ඇත. එබැවින් 1978 දී මෙම අංශයේ නිෂ්පාදනය වර්ධනය වීමට බොහෝදුරටම හේතුවූයේ උළු ගඩොල් කර්මාන්තයෙහි සීඝ්‍ර ව්‍යාප්තියක් සහ තැනීම් කටයුතු අංශයෙහි අධිකතර නැගීමක් මගින් උද්ගත වූ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා තැනීම් කටයුතු අංශය වර්ධනය වීමය.

කාර්මික අංශයෙහි නිෂ්පාදනය 1978 දී සියයට 9 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. වැවිලි බෝග සැකසුම් අංශයෙහි උපනතීන් පිළිබිඹු කරමින් එම අංශයේ නිෂ්පාදනය සියයට 2 කින් වර්ධනය විය. මෙසේ වුවද, කම්හල් කර්මාන්ත 1978 දී සියයට 11 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඉකුත් වර්ෂයේදී එහි වූයේ සියයට 1 ක නොසැලකිය යුතු තරම් වර්ධනයකි. 1977 නොවැම්බර් මාසයෙන් පසු ආනයන ලිහිල් කිරීමේ හේතුවෙන් අමුද්‍රව්‍ය හා අමතර කොටස් වැඩියෙනුත්, වඩා පහසුවෙනුත් ලබාගත හැකිවීමේ හේතුවෙන් ධාරිතාව වැඩියෙන් උපයෝගී කර ගැනීමට කර්මාන්ත වලට හැකිවිය. 1977 දී සියයට 3 කින් පහත වැටුණු රජයේ කර්මාන්තවල නිෂ්පාදනය 1978 දී සියයට 10 කින් වැඩිවූ අතර, පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය සියයට 14 කින් පමණ වැඩි විය. සුළු කර්මාන්තවල නිෂ්පාදනය 1978 දී සියයට 6 කින් පමණ ඉහළ නැංගේය. වඩා ලාභ එහෙත් උසස් වර්ගයේ ආනයන සමග තරඟ කිරීමට නොහැකි වීමේ හේතුවෙන් සුළු කර්මාන්ත බොහොමයකටම, විශේෂයෙන් සුළු අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයට බැරෑරුම් ප්‍රශ්න වලට මුහුණ පෑමට සිදු වූ බවට සාක්ෂි එමට ඇත. එසේ වුවද අනෙකුත් ගෘහ කර්මාන්ත (විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයට අදාළ) සෑහෙන වර්ධනයක් පෙන්විය.

1978 දී පතල් හා කැනීම් අංශයට පසු වඩාත්ම ගතික ස්වභාවයක් ඉසිලූ අංශය වූයේ, තැනීම් කටයුතු අංශයයි. මෙම අංශයේ ඇස්තමේන්තුගත වර්ධනය සියයට 31 ක් විය. මෙම වර්ධනයට බොහෝ දුරටම හේතු වන්නට ඇත්තේ වර්ෂය තුළදී ගොඩනැගිලි ද්‍රව්‍ය වඩාත් පහසුවෙන් ලබාගත හැකිවීමය. 1978 දී සිමෙන්ති අලෙවිය සියයට 65 කින් කැපී පෙනෙන ලෙස වැඩි වූ අතර, යකඩ, වානේ, ඇස්බැස්ටොස් සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සුලභව තිබුණි. තාවකාලික ඇස්තමේන්තු අනුව රාජ්‍ය අංශයේ පාරවල්, පාලම්, වාරිමාර්ග වැඩ සහ වෙනත් අවශේෂ තැනීම් කටයුතු සියයට 16 කින් වැඩි වූ අතර පෞද්ගලික අංශයේ තැනීම් කටයුතු විශේෂයෙන්ම නිවාස හා නව කර්මාන්ත සෑහෙන අයුරින් වර්ධනය විය.

කෘෂිකර්මය, කර්මාන්ත සහ පතල් හා තැනීම් කටයුතු යන අංශවල වර්ධනය හේතුකොට ගෙන වෙළඳ, ප්‍රවාහන හා අනෙකුත් සේවා යන අංශවල නොවැලැක්විය හැකි ප්‍රතිඵල දක්නා ලදී. 1978 දී ප්‍රවාහන අංශය සියයට 7 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ආනයන ලිහිල් කිරීමෙන් පසු 1978 දී වැඩි තරඟයක් මෙන්ම ප්‍රවාහන ගාස්තු වල අඩු වීමේ නැඹුරුවකට මග පාදමින් වෑන් සහ ලොරි ආනයනය පස් ගුණයකින් පමණ වැඩි වී ඇත. එසේ වුවද, ප්‍රවාහන ධාරිතාවයෙහි මෙකී විශාල වැඩි වීමේ පූර්ණ බලපෑම ඉදිරි වර්ෂ වලදී දැනෙනු ඇත. ආනයන ලිහිල් කිරීම නිසා තොග හා සිල්ලර වෙළඳ අංශයෙහිද සෑහෙන වර්ධනයක් ඇති විය. මෙහි වර්ධනය සියයට 10 ක් වේ යයි ඇස්තමේන්තු කර ඇත. දේශීය නිෂ්පාදිත වෙළඳාම සියයට 12 කින් වැඩිවිය. ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වයේ විශාල වර්ධනය අනුව යමින් බැංකු හා මූල්‍ය කටයුතු අංශයෙහි එකතු වූ අගය සියයට 15 කින් වැඩි විය. හෝටල් සහ ආපනශාලා ආදිය ඇතුළත් වන අනිකුත් සේවා අංශයේ නිපැයුම සියයට 6 කින් ඉහළ ගියේය.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

1978 දී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 53,742 ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. මෙය 1977 ට වඩා සියයට 43 ක වැඩි වීමකි. මෙකී සම්පත් ප්‍රමාණයට රුපියල් 38,550 ක දළ දේශීය නිෂ්පාදිතය සහ රුපියල් දශලක්ෂ 15,350 ක භාණ්ඩ හා සේවා ආනයන ඇතුළත් වෙයි. මෙම සංඛ්‍යා වලට වර්ෂය තුළ වූ මිළ වැඩිවීම් ඇතුළත් වන හෙයින් ඒවා පහත සංඛ්‍යා සටහනෙහි උචිත පරිදි ගලපනු ලැබ ඇත.

## 1·3 වැනි සංඛ්‍යා සටහන

## සම්පත් සංයුතිය සහ උපයෝගීකරගත් ආකාරය – 1977–78

| වර්ගය | 1977 | | 1978 | | 1977 මිල අනුව 1978 | | ප්‍රතිශතක වර්ධනය 1978/77 |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | % | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | % | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | % | |
| 1. මුළු සම්පත් .. .. | **37,860** | 100 | **53,900** | 100 | **42,197** | 100 | 11·5 |
| 1·1 දළ දේශීය නිෂ්පාදිතය .. | 31,352 | 83 | 38,850 | 72 | 33,954 | 80 | 8·3 |
| 1·2 භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයන .. | 6,508 | 17 | 15,350 | 28 | 8,243 | 20 | 26·7 |
| 2. උපයෝගීකරණය . .. | **37,860** | 100 | **53,900** | 100 | **42,197** | 100 | 11 5 |
| 2·1 පාරිභෝජනය . | 25,306 | 67 | 32,381 | 60 | 28,084 | 66 | 11·0 |
| 2·2 දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 5,035 | 14 | 8,280 | 15 | 6,233 | 15 | 23·8 |
| (අ) රජය .. . | (1,542) | (4) | (3,077) | (6) | (2,049) | (6) | (32·8) |
| (ආ) රජයේ සංයුක්ත මණ්ඩල · | (861) | (3) | (1,815) | (3) | (1,066) | (3) | (23·8) |
| (ඉ) පුද්ගලික අංශය ., | (2,632) | (7) | (3,388) | (6) | (3,158) | (6) | (20·0) |
| 2·3 භාණ්ඩ තොග ·, | 159 | ... | 33 | (...) | 27 | . . | — |
| 2·4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 7,360 | 19 | 13,207 | 25 | 7,853 | 18 | 6·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1978 දී මුළු සම්පත් ප්‍රමාණය මූර්ත වශයෙන් සියයට 12 කින් ඉහළ නැග ඇත. මුළු සම්පත් වලට ගැනෙන දළ දේශීය නිෂ්පාදිතයෙහි කොටස සියයට 83 සිට 80 දක්වා පහත වැටුණ අතර ආනයන කොටස සියයට 17 සිට 20 දක්වා වැඩිවිය. ආනයන වර්ධනය වූයේ වෙළඳාම නිදහස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

ඉකුත් වර්ෂයේදී මෙන් මෙකී සම්පත් උපයෝජනයෙහි පාරිභෝජන කොටස 1978 දී සුළු වශයෙන් පහත වැටුණි. මූර්ත වශයෙන් පරිභෝජනයෙන් සියයට 11 ක වැඩිවීමක් තිබියදී මෙම කොටස සියයට 67 සිට 66 දක්වා පහත වැටුණි. අනෙක් අතට ඉකුත් වර්ෂයේදී ඉහළ ගිය අපනයන කොටස සියයට 19 සිට 18 දක්වා පහත වැටුණි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 24 කින් සැළකිය යුතු ලෙස වැඩි වූ අතර, මුළු සම්පත් උපයෝජනයෙහි එහි කොටස සියයට 14 සිට 15 දක්වා ඉහළ ගියේය. රජයේ ආයෝජන සියයට 33 කින් වැඩිවූ අතර, රජයේ සංස්ථා සහ පෞද්ගලික අංශයේ ආයෝජන පිළිවෙලින් සියයට 24 කින් හා සියයට 20 කින් වැඩි විය.

ආර්ථිකයෙහි දේශීය ඉතිරිකිරීම ප්‍රමාණය, විදේශීය සම්පත් (භාණ්ඩ හා සාධක නොවන සේවා ශුද්ධ ආනයන) අඩු කරනු ලැබූ ආයෝජන (එනම්: දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සහ තොග වෙනස් වීම) වල එකතුව හැටියට ඇස්තමේන්තු කළ හැකිය.

## 1·4 සංඛ්‍යා සටහන

### දේශීය ඉතුරුම්

| | 1974* | 1975* | 1976* | 1977* | 1978 |
|---|---|---|---|---|---|
| 1· වෙළඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 21,701 | 24,183 | 26,443 | 31,352 | 38,392 |
| 2· විදේශ සම්පත් (භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන - ශුද්ධ -) .. | 1,040 | 1,203 | 427 | – 852 | 1,867 |
| 3· ආයෝජන .. .. | 3,139 | 3,909 | 4,193 | 5,194 | 8,313 |
| 4 දේශීය ඉතුරුම් .. .. | 2,099 | 2,706 | 3,766 | 6,046 | 6,446 |
| 5· ඉතිරි කිරීම් අනුපාතය (4. එකෙහි ප්‍රතිශතයක් ලෙස) | 9·7 | 11·2 | 14·2 | 19 3 | 16·8 |

• තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැ කුව.

වෙළඳ මිළ අනුව වූ දළ දේශීය නිෂ්පාදිතය 1978 දී සියයට 22 කින් ඉහළ ගිය නමුත් එකී මිළ අනුව මනිනු ලැබූ දේශීය ඉතිරිකිරීම් වැඩිවූයේ සියයට 4 කින් පමණි. ආයෝජන රුපියල් දශලක්ෂ 2,961 කින් හෙවත් සියයට 57 කින් වැඩිවූ නමුදු ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ ක්‍රියාකාරිත්වය හේතු කොටගෙන භාණ්ඩ හා සේවා ආනයනයෙහි ශුද්ධ වෙනස රුපියල් දශලක්ෂ 2,719 ක් විය. මෙහි ප්‍රතිඵලය වශයෙන් දේශීය ඉතිරිකිරීම් වැඩිවූයේ රුපියල් දශලක්ෂ 244 කින් පමණි. එසේම 1978 දී ඉතිරිකිරීම් අනුපාතයද සියයට 19 සිට 16 දක්වා පහත වැටුණි.

## කෘෂිකර්මය

රබර් සහ පොල් නිෂ්පාදනයෙහි නැගීම, තේ නිෂ්පාදනයෙහි අඩුවීම, වීනිෂ්පාදනයෙහි තවදුරටත් ඇතිවූ වර්ධනය සහ අනෙක් වගාවන්හි නිෂ්පාදනය සාමාන්‍යයෙන් නොවෙනස්ව පැවතීම 1978 කෘෂිකර්ම අංශයෙහි කැපී පෙනෙන ලක්ෂණයන්ය. මාළු නිෂ්පාදනය වැඩි විය. එහෙත් මෙම වර්ධනය සත්ව පාලන කර්මාන්තයෙහි පහත බැසීම හේතුකොට ගෙන ඇති වූ සත්ව මාංශජනක ධාතු අවශ්‍යතාවයන්හි හිඟකම මකාලීමට තරම් ප්‍රමාණවත් නොවී ය. නොවැම්බර් මාසයේදී සුළි සුළඟක් මගින් නැගෙනහිර ප්‍රදේශයේ පොල්, වී, කජු සහ වන කර්මාන්තයට බෙහෙවින් හානි පමුණුවමින් එම ප්‍රදේශය විනාශයට පත්කරනු ලැබීය. සමස්ථයක් වශයෙන් ගත් කල 1978 වර්ෂය කෘෂිකර්ම අංශයට අසම ප්‍රතිඵල සහිත වර්ෂයක් විය.

වර්ෂය ආරම්භයේ දී කෘෂි අංශයේ සංවර්ධනය පිළිබඳව වගකිවයුතු අමාත්‍යාංශ 3 ක් විය. එනම්, කෘෂිර්ම සහ ඉඩම්, වැවිලි කර්මාන්ත සහ ධීවර යන අමාත්‍යාංශයන්ය. වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයන් 6 ක් විය. කෘෂිකර්ම සංවර්ධන සහ පර්යේෂණ අමාත්‍යාංශය වී, අතිරේක ආහාර භෝග සුළු අපනයන භෝග වගාවන් සහ මෙම කටයුතු හා සම්බන්ධ පර්යේෂණ සහ ව්‍යාප්ති කටයුතු පිළිබඳ වගකිවයුතු අමාත්‍යාංශය බවට පත්කරන ලදී. කලින් පැවති කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉඩම් සංවර්ධනය සහ පවරා දීමේ කටයුතු අළුතින් ඇතිකරන ලද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයටද, සත්ව පාලන සංවර්ධන කටයුතු තවත් අළුතින් ඇතිකරන ලද ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයටද පවරනලදී. රටෙහි ඉඩම් ප්‍රමාණයෙන් සියයට 40 ක පමණ ප්‍රමාණයක් අයත්වන මහවැලි ගංගා නිම්න සංවර්ධනය මහවැලි සංවර්ධන අමාත්‍යාංශය නම් නව අමාත්‍යාංශයට පැවරීමට තරම් වැදගත් ලෙස සලකනු ලැබීය. වැවිලි අංශය සම්බන්ධව ප්‍රධාන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව පොල් කර්මාන්ත අමාත්‍යාංශය යනුවෙන් නව අමාත්‍යාංශයක් පිහිටුවන ලදී.